# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

2014 අගෝස්තු



අගෝස්තු 14 වන දින කොළඹදී පැවැත්වුණු අතුරුදහන් වූවන්ගේ පවුල් වල හමුවක් බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙවන ලද මැර කණ්ඩායමක් ආක්‍රමණය කළ අතර එහිදී ඔවුන් වෛරී සහගත සටන්පාට කියමින්, අසත්‍ය චෝදනා ඉදිරිපත් කරමින් අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත තර්ජනාත්මක ස්වරූපයක් පෙන්වමින් හැසිරුණු ආකාරය ( © Malani Manel Perera)


INFORM Human Rights Documentation Centre

www.ihrdc.wordpress.com informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

A. රජය විවේචනය කරන සහ රජයට අභියෝගයක් විය හැකි පුද්ගලයන් වෙත මරණ තර්ජන, හිරිහැර, බිය ගැන්වීම්, සහ සීමා පැනවීම

B. මානව හිමිකම් ආරක්ෂකයින්ව ප්‍රශ්ණ කිරීම

C. අදහස් ප්‍රකාශකිරීමේ නිදහස උල්ලංඝණය කිරීම

D. සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම්

E. සංවිධාන ගත වීමේ නිදහස උල්ලංඝණය කිරීම ( රාජ්‍ය නොවන සංවිධාන බිය වැද්දවීම සහ සීමා පැනවීම)

F. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

G. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

*ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙහි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත්වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙළෙසීමට ලක්වන අනෙක් ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය, මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.*

## සාරාංශය

බලහත්කාර අතුරුදහන්කිරීම්හි වින්දිතයන් පිළිබඳ ජාත්‍යන්තර දිනය අගෝස්තු 30වන දිනට යෙදී තිබුණි. කෙසේ වුවත් බෞද්ධ භික්ෂූන් විසින් මෙයෙවන ලද මැර කණ්ඩායම්, පොලීසිය සහ රාජ්‍ය පාලිත මාධ්‍ය විසින් එල්ල කළ තර්ජන, බිය ගැන්වීම්, සීමා සහ අසත්‍ය චෝදනා වලට ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූවන්ගේ පවුල් වල සාමාජිකයන් සහ ඔවුන්ට සහය දක්වන පුද්ගලයන් මුහුණ දුන්නේද එම මාසයේදීය. එම දිනය සැමරීම සඳහා වවුනියාවේදී පැවැත්වුණු සාමකාමී රැළියකට පොලීසිය විසින් බාධා කරන ලදී. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජනාධිපති කොමිසම වෙත ප්‍රකාශ ලබා නොදෙන ලෙසට මන්නාරමේ දෙමළ අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත තර්ජන එල්ල විය. අගෝස්තු මාසය මුල කොළඹ දී පැවැත්වුණු අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ පෞද්ගලික හමුවකට බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙයවනු ලැබූ මැර කණ්ඩායමක් කඩා වැදුණි. මෙම හමුව පැවැත්වුණේ කතෝලික රැස්වීම් මධ්‍යස්ථානයකදීය. සංවිධායකයන් විසින් මේ සිදුවීම පොලීසිය වෙත දැනුම් දුන්නද හමුවට සහභාගී වූ පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පොලීසිය විසින් ප්‍රතික්ෂේක ලද අතර ආරක්ෂාව ලබා දීම වෙනුවට හමුව නවත්වා උතුරේ සිට පැමිණ සිටි පුද්ගලයන් නිවෙස් බලා යවන ලෙසට බලපෑම් කරන ලදී. ආරම්භයේදී මැර කණ්ඩායම විසුරුවා හැරීමද පොලීසිය විසින් ප්‍රතික්ෂේප කළ අතර ඔවුන් පසුව ක්‍රියාත්මක වූයේ සංවිධායකයින්ගේ සහ සහභාගීවූවන්ගේ දැඩි ඉල්ලීම මත පමණි. මෙම සිදුවීම තවත් සිදුවීම් දාමයක ආරම්භය විය. අනතුරුව සහභාගීවූවන් සහ සංවිධායකයින් වෙත සිංහල පුවත්පත් සහ මැර කණ්ඩායම විසින් සාවද්‍ය දෝෂාරෝපණ ගණනාවක් එල්ල කරන ලදී. එම සාවද්‍ය දෝෂාරෝපණ අතර සහභාගිවූ පිරිස ත්‍රස්තවාදීන්ට සම්බන්ධ බවද කියැවිණ. මේ සඳහා සහභාගිවූ ගරු සත්‍යවේල් පියතුමාට තර්ජන ගණනාවක් එල්ල විය. මෙවැනි වැඩසටහන් සඳහා සහභාගී නොවන ලෙස විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය විසින් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් වෙත අනතුරු හගවමින් පුකහයක් නිකුත් කරන ලද අතර එහිලා අදාල හමුව කඩාකප්පල් කිරීම හෙළා නොදකින ලදී,

2014 ජූනි මාසයේ ඇතිවූ මුස්ලිම් විරෝධී කෝලාහලයේ සැකකරුවන් නිදහස් කිරීම ප්‍රතික්ෂේප කළ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට සහ රජයේ දේශපාලඥයෙකුට විරුද්ධව නඩුවක් ගොනු කර ඇති පාසල් ගුරුවරියකට මරණ තර්ජන වලට මුහුණ දීමට සිදුවිය. මානව හිමිකම් පිළිබඳ ප්‍රමුඛ ක්‍රියාකාරිකයෙකු වන උතුරේ දෙමළ පළාත් සභා නියෝජිතයෙකු ද පරීක්ෂා කිරීම් සහ තර්ජන පිළිබඳ පැමිණිළි කර ඇත. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණයවීම් දිගටම සිදු විය. වවුනියාවේ දෙමළ ජනමාධ්‍යවේදියෙකුට මරණ තර්ජන එල්ල විය. පොලීසිය විසින් යාපනය මාධ්‍ය සංගමයේ සම්බන්ධීකාරකවරයාගෙන් ප්‍රශ්ණ කරන ලද අතර සිංහල පුවත් පතක් විසින් ඔහු එල්.ටී.ටී.ඊ යට සම්බන්ධ බවට චෝදනා කරන ලදී. පශ්චාත් යුධකාලයේ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සඳහා පැමිණි ඉන්දීය විද්වත් ක්‍රියාකාරිකයෙකු සම්මන්ත්‍රණයට පෙර නැගෙනහිර පළතේ සංචාරයක යෙදීමට සූදානම් වූ අවස්ථාවේදී ප්‍රශ්ණ කිරීම වලට සහ රඳවා තබා ගැනීමට ලක් විය. මුස්ලිම් ජනමාධ්‍යවේදීන් "සිංහල විරෝධී සහ බෞද්ධ විරෝධී ජිහාඩ්වරු" යනුවෙන් හඳුන්වමින් යැවුණු ඊමේල් පිළිබඳ වාර්තාවක් පල විය. පසුගිය ජූනි මාසයේ සිට තමන්ට වීසා නිකුත් කිරීම ශ්‍රී ලංකාන්ඩුව විසින් පමාකර ඇති බව New York Times වාර්තාකරු ප්‍රකාශ කළේය. ආරක්ෂක අමාත්‍යංශ ලේකම්වරයාගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී අධිකරණ කටයුතු වාර්තාකිරීමෙන් ජනමාධ්‍යවේදීන් වලක්වන ලදී. කොළඹ පිහිටි පාසලක දෙමළ භාෂාවෙන් ජාතික ගීය ගායනා කිරීම පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට නියෝගයක් නිකුත් විණ.

සමාගමයේ නිදහස සහ සංවිධාන ගතවීමේ නිදහසටද ප්‍රහාර එල්ල විය. අන්තර් ආගමික සමගිය පිළිබඳ වූ වැඩසටහන් 4ක් පරීක්ෂාවට ලක් වූ බව ජාතික සාම මණ්ඩලය වාර්තා කළේය. ජාතික සාම මණ්ඩය විසින් දකුණු සහ මධ්‍යම පළාත් වල සංවිධානය කළ වැඩසටහන් දෙකක් පොලීසියේ සහ නැගෙනහිර පළාතේ පැවැත් වූ වැඩසටහන් දෙකක් ආරක්ෂක හමුදාවේ නිරීක්ෂණයට ලක් විය. වෘත්තීය සමිති රැස්වීම් සහ ක්‍රියාකාරකම්ද විවිධ දුෂ්කරතා වලට ලක් විය. රාජ්‍ය නොවන සංවිධාන ආරක්ෂාවට තර්ජනයක් බවත් ඒවා නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට නව නීති ඉදිරියේදී සම්පාදනය වනු ඇති බවත් රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ප්‍රකාශ කළේය.

විශ්ව විද්‍යාල දෙකක ශිෂ්‍ය ක්‍රියාකාරිකයින්ගේ පංති තහනම් කර අත්තංඩංගුවට ගන්නා ලදී. දෙමළ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් දෙදෙනෙකු (එක් ශිෂ්‍යයෙකු අත්තඩංගුවට ගෙන ඇත්තේ මැර කණ්ඩායමකගේ පහරදීමට ලක්වී තුවාල ලැබීමෙන් පසුය) ත්‍රස්ත විරෝධී නීති යටතේ අත්අඩංගුවට ගෙන රඳවා ගෙන සිටීම පිළිබඳව ශිෂ්‍ය ක්‍රියාකාරීන් විරෝධය දැක්වූ අවස්ථාවේදී උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් මහා ශිෂ්‍ය සංගමය වාර්ගික අසමගිය අවුළුවන බවට චෝදනා කළේය. විපක්ෂ

දේශපාලන පක්ෂ ඌව පළාත් සභා මැතිවරණය දිනය දක්වාම නිරන්තර සහ ක්‍රමානුකූල බිය ගැන්වීම වලට සහ ප්‍රහාර වලට ලක් විය.

සිදුවීම් ගණනවකදීම විසම්මුතිය මර්දනය කිරීම සම්බන්ධයෙන් පොලීසිය, ආරක්ෂක හමුදා සහ රජය සෘජුවම වගකිව යුතු බව පෙනෙන්නට තිබුණි. රජයෙන් බාහිර කණ්ඩායම් විසින් විසම්මුතිය පාගා දමන අවස්ථාවලදී පොලීසිය නීතිය ක්‍රියාත්මක කරනවා වෙනුවට සහය දැක්වූයේ එවැනි කළහකාරී කන්ඩායම් වෙතය.

## A. රජය විවේචනය කරන සහ අභියෝගයක් විය හැකි පුද්ගලයන් වෙත මරණ තර්ජන, හිරිහැර, බිය ගැන්වීම්, සහ සීමා පැනවීම්

### 1. රජයේ දේශපාලඥයෙකුට විරුද්ධව නඩුවක් ගොනු කර ඇති ගුරුවරියට මරණ තර්ජන



නවගත්තේගම නවෝද්‍යා විද්‍යාලයේ ගුරුවරියක් වන සුසිලා හේරත් මහත්මිය තමන්ට එවා තිබූ මරණ තර්ජන ඇතුළත් ලිපිය පෙන්වමින්
(Photo: Ada Derana)

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හිටපු පළාත් සභා මන්ත්‍රී ආනන්ද සරත් කුමාර මහතාට එරෙහිව නඩුවක් ජයග්‍රහණය කළ නවගත්තේගම නවෝද්‍යා විද්‍යාලයේ ගුරුවරියක වන සුසිලා හේරත් මහත්මිය දූෂණය කර මරා දමන බවට තර්ජනය කරමින් 2014 අගෝස්තු 05 වන දින ලිපියක් එවා තිබුණු බව වාර්තා විය. තමා ඇතුළු සිය පවුලේ සාමාජිකයන්ගේ ජීවිත අනතුරේ බව හේරත් මහත්මිය මාධ්‍ය වෙත ප්‍රකාශ කර තිබුණි. 'මම සාක්ෂිකරුවන්ව මැරුවා....උඹේ රෙදි ගලවලා දූෂණය කරලා මරනවා,මගේ දේශපාන ගමන නැති කරාට තෝ මරලා කෑලි කරනවා.' යනුවෙන් ලිපියේ සඳහන් වී තිබුණු බව වාර්තා විය.
http://www.adaderana.lk/news/-death-threat-on-navagattegama-teacher (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 2. උතුරේ දෙමළ මන්ත්‍රීවරුන්ට තර්ජන සහ හිරිහැර

උතුරු පළාත් සභා මන්ත්‍රී ආනන්දි සසිදරන් මහත්මිය විසින් සුදු වෑන් රථයක් සහ යතුරුපැදි කණ්ඩායමක් තමා පසුපස නිරන්තරයෙන් හඹා එමින් තමන්ගේ සෑම කටයුත්තක්ම නිරීක්ෂණය කරන බවට වඩ්ඩුකොඩෙඩ පොලීසිය වෙත පැමිණිල්ලක් සටහන් කර ඇති බවට වාර්තා විය. ඇය ජීවත් වන ප්රදේශයේ කිසිදු සුදු වෑන් රථයක හෝ මෝටර් රථ කණ්ඩායමක් පිළිබඳ කිසිදු වාර්ථාවක් නොමැති බව පොලීසිය විසින් පවසා ඇති බව ද වාර්තා විය. ඇතැම් උතුරු පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දී තිබුණු පොලිස් ආරක්ෂාව ඉවත් කිරීම පිටුපස ආරක්ෂක අමාත්‍යාංශය සිටින බව වාර්තා වී ඇති බව උතුරු පළාත්සභා සභාපති C. V. K.සිවඥානම් මහතා ප්‍රකාශ කළේය.
http://www.tamilnet.com/art.html?catid=79&artid=37330 (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14.)

### 3. මන්නාරම අවට අතුරුදහන් වූවන්ගේ පවුල් වල වලට තර්ජන

මන්නාරමෙහි ශ්‍රී ලංකා පොලීසිය සහ ආරක්ෂක හමුදාවේ බුද්ධි අංශ නිලධාරීන් විසින් අතුරුදහන්වූවන් පිළිබද ජනාධිපති කොමිසම ඉදිරියේ පෙනී සිටීමට සූදානමින් සිටි අතුරුදහන්වූ පුද්ගලයන්ගේ ඥාතීන්ට සහ පවුල්වලට තර්ජනය කර ඔවුන්ට හිරිහැර පමුණුවා ඇති බව මාධ්‍ය වාර්තා කළේය. අතුරුදහන්වූවන් පිළිබද ජනාධිපති කොමිසම මන්නාරම දිස්ත්‍රික්කයේ පුද්ගලයන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීම අගෝස්තු 08 සිට 11 වන දින දක්වා සිදු කරන ලදී. මෙම කොමිසම හමුවේ පෙනී සිටීමෙන් කිසිදු ඵලක් නොමැතියැයි ආරක්ෂක හමුදාවේ බුද්ධි අංශ නිලධාරීන් විසින් පවසා ඇති බව මන්නාරමේ පුරවැසි කමිටුවේ සභාපතිවරයා විසින් මාධ්‍ය වලට ප්‍රකාශ කර සිටියේය.

http://tamilnet.com/art.html?catid=13&artid=37339 (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 4. බුද්ධි අංශ නිලධාරීන් විසින් නීතිඥ සංගමයේ සභාපතිවරයා ලුහුබැඳීම

නීතිඥ සංගමයේ සභාපති උපුල් ජයසූරිය මහතාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා බුද්ධි අංශ නිලධාරීන් යොදවා ඇති බව ජයසූරිය මහතාගේ ආරක්ෂාව පිළිබද නඩුව අධිකරණයේ විභාග වන අවස්ථාවේදී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පරීක්ෂ අනුර සේනානායක මහතා විසින් අධිකරණයට පවසා තිබුණි. මෙම වැරදි වැටහීම පැහැදිළි කර ගැනීම සඳහා ආරක්ෂාව සඳහා යොදවා ඇති නිලධාරීන්ගේ අනන්‍යතාවය පොලීසිය විසින් අනාවරණය කළ යුතු බව ජයසූරිය මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු කියා සිටියහ.

http://www.asianmirror.lk/news/item/2649-senior-dig-says-27-intelligence-officers-are-behind-basl-president

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 5. ක්‍රියාකාරී දේවගැතිවරයකු බිය ගැන්වීම

2014 අගෝස්තු මාසයේදී ප්‍රකට මානව හිමිකම් ආරක්ෂකයෙකු සහ දෙමළ ක්‍රිස්තියානි (ඇන්ග්ලිකානු) දේවගැතිවරයකු වන පූජ්‍ය සතිවේල් පියතුමා බිය ගැන්වෙන සහ සැක කටයුතු ආකාරයේ සිදුවීම් ගණනාවකට මුහුණ දුන්නේය. සතිවේල් පියතුමා අගෝස්තු 09වන දින වේයන්ගොඩ සිය දේවස්ථානයේ සිට කොළඹ බලා බසයකින් පැමිණෙමින් සිටියේදී බස් රථයේ වෙනත් ආසන තිබියෙදීත් පුද්ගලයෙකු පැමිණ සතිවෙල් පියතුමා අසලින් අසුන් ගෙන ඇත. පසුව ඔහු විසින් සතිවේල් පියතුමාට සුළු සුළු ශාරීරික පීඩා කරමින් (අතෙන් අනිමින් සහ තද කරමින්) බිය ගන්වන ආකාරයෙන් හැසිරී ඇත. තමාව ගැටුමකට පොළඹවා ගැනීමට දරන උත්සාහයක් බව තේරුම් ගත් සතිවේල් පියතුමා වෙනත් ආසනයකට මාරුවී ඊළඟ නැවතුමේදී බසයෙන් බැස වෙනත් බසයක නැගී වේයන්ගොඩ බලා ගොස් ඇත. මෙම සිදුවීම සිදුවූ දිනයේ සැක කටයුතු පුද්ගලයන් කිහිප දෙනෙක් දේවස්ථාන භූමියේ ගැවසෙන දුටු බව දේවස්ථාන සාමාජිකයෙකු විසින් සතිවෙල් පියතුමාට දැනුම් දී ඇත. අගෝස්තු 09 වන දින රාත්‍රී 8ට පමණ දේවස්ථානයේ නාන කාමරයේ සිටියෙදී කිසියම් පුද්ගලයෙකු විසින් තමාව ජංගම දුරකථනයකින් රූප ගත කිරීමට උත්සහ කළ බව තවත් පුද්ගලයෙකු විසින් වාර්තා කර තිබුණි. වීදුරු ආවරණය කළ සුදු වෑන් රථයක් අගෝස්තු 14 වන දින දේවස්ථානයේ ගේට්ටුව ඉදිරිපිට නවත්වා තිබූ බව සහ වෙනත් දේවගැතිවරයෙක් ගේට්ටුව අසලට ගිය විට වෑන් රථය වේගයෙන් පිටත්ව ගොස් ඇත. සතිවේල් පියතුමා රජය විසින් මෑතකදී යෝජනා කළ බීජ පණතෙහි ස්වභාවය සහ ආදීනව පිළිබඳව ගොවියන් සමග සාකච්ඡා කිරීමට අගේස්තු 16 වන දින වේයන්ගොඩ සිය දේවස්ථාවයට ගොස් ඇත. කෙසේවුවත් සතිවෙල් පියතුමාට කිසියම් හානියක් විය හැකි බවට ආරංචි වීම නිසා නැවත කොළඹ බලා යන ලෙස ඔහුගේ ජ්‍යෙෂ්ට දේවගැතිවරුන් විසින් දැනුම් දී ඇත. සතිවේල් පියතුමා අගෝස්තු 22 වන දින උදෑසන 6ට පමණ විහාරමහා දේවී උද්‍යානයේ ව්‍යායාම කිරීමට ගොස් සිටි අවස්ථාවේදී ආරක්ෂක හමුදා භටයෙකු විසින් ඔහුගේ ජංගම දුරකතනයෙන් විනාඩි තුනක් පමණ සතිවේල් පියතුමාව රූප ගත කර ඇත. මෙම තර්ජන ආරම්භ වී ඇත්තේ 2014 අගෝස්තු 04 වන දින කොළඹදී පැවති අතුරුදහන් වූවන්ගේ පවුල්වල හමුව කඩාකප්පල් කළ මැර කණ්ඩායම මෙහෙයවූ බෞද්ධ භික්ෂූන විසින් සතිවේල් පියතුමා ඔහුගේ දේවස්ථානයෙන් පන්නා දමා ඇති බවට චෝදනා කිරීමෙන් අනතුරුවය. සතිවෙල් පියතුමාද එම හමුවට සහභාගී වී සිටි අතර මැර කණ්ඩායම රැස්වීම් ශාලාවට ඇතුළු වීමට උත්සාහ දැරූ අවස්ථාවේ ඔවුන් නැවැත්වීමට සහ අදාළ ස්ථානයෙන් මැර පිරිස ඉවත් කිරීම සඳහා පොලීසියට බල කිරීමට පෙරමුණ ගෙන කටයුතු කළේය.



2014 අගෝස්තු 4 වන දින පැවති අතුරුදහන්වූවන්ගේ පවුල් වල හමුව ට කඩා වැදි බෞද්ධ භික්ෂූන් සතිවේල් පියතුමා වෙත බැණ දින අයුරු. (© Melani Manel Perera)

## 6. අතුරුදහන්වූවන්ගේ පවුල් සහ අතුරුදහන්කිරීම් විරෝධී ක්‍රියාකාරීන් පිළිබද අසත්‍ය දෝෂාරෝපණ

“මිය ගිය සහ අතුරුදහන් වූවන්ගේ දෙමාපිය පෙරමුණ” විසින් අගෝස්තු 14 වන දින පැවති දෙමළ අතුරුදහන් වූවන්ගේ පවුල් වල රැස්වීමක් කඩාකප්පල් කරන ලදී. එම සිදුවීමෙන් පසු දින (අගෝස්තු 5) එම පෙරමුණ විසින් මාධ්‍ය සාකච්ඡාවක් කැදවා අතුරුදහන්වූවන්ගේ පවුල් සහ අතුරුදහන්කිරීම් විරෝධී ක්‍රියාකාරීන් කෙරෙහි අසත්‍ය චෝදනා එල්ල කරමින් ඔවුන්ව අපකීර්තියට ලක් කරන ලදී. රදගුරු රායප්පු ජෝසප් හිමිපාණන් (මන්නාරමේ කතෝලික සභාවේ රදගුරු), සෙබාමලෛ පියතුමා (මන්නාරමේ පුරවැසි කමිටුවේ සභාපති) , සතිවේල් පියතුමා, ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, බ්‍රිටෝ ප්‍රනාන්දු සහ රුකී ප්‍රනාන්දු යන අය ගේ නම් මෙහිදී ප්‍රකාශයට පත් කළ අතර ඔවුන් අතුරුදහන්වූවන්ගේ පවුල්හි සත්‍ය සහ යුක්තික සොයා යන අරගලයට නිරන්තරයෙන් සහය දැක් වූ පුද්ගලයන් වේ. නිමල්කා ප්‍රනාන්දු සහ බ්‍රිටෝ ප්‍රනාන්දු රටේ ස්වාධිපත්‍යයට විරුද්ධව කටයුතු කරන අය වන බව, රුකී ප්‍රනාන්දු නැවත හිස ඔසවන ඒල්.ටී.ටී.ඊ සංවිධානයේ සාමාජිකයන්ට ආරක්ෂාව ලබා දී ඇති බව, සතිවේලි පියතුමා ක්‍රිස්තියානි පල්ලියෙන් ඉවත් කර ඇති බව සහ ඔහුට නවාතැන් ගැනීමටවත් ස්ථානයක් නොමැති බව, සතිවේල් පියතුමා අතුරුදහන් වූවන්ගේ පවුල් හමුවේදී බෞද්ධ භික්ෂුවකට පහර දී ඇති බව සහ එහිදී තත්වය උණුසුම් අතට හැරීම සම්බන්ධයෙන් ඔහු ප්‍රධාන වගකීම ගත යුතු බව, පෙරටුගාමී දේශපාලන පක්ෂය එහි ආරම්භයේ පටන්ම එල්.ටී.ටී.ඊ හිතවාදී සහ දෙමල ඩයස්පෝරාවට හිතවාදී බව, රදගුරු රායප්පු ජෝසප් පියතුමා දශක ගණනාවක් මුළුල්ලේම එල්.ටී.ටී.යට සහය දී ඇති බව, ඔහුගේ සහායක සෙබාමලෛ පියතුමා මෙවැනි වැඩසටහන් සංවිධානය කර දිගින් දිගමට ඒවාට ජනතාව සහභාගී කරවූ බව සහ නීතීඥ J. C. වැලිඅමුණ මහතා ජාතිද්‍රෝහියෙක් සහ ඔහු සිය වෘත්තිය පාවා දෙන්නෙක් බව මෙම චෝදනා අතර විය. උතුරේ සිට පැමිණි සියළුම පුද්ගලයන්ගෙන් ප්‍රශ්ණ කළ යුතු බවද බෞද්ධ භික්ෂුව කියා සිටියේය.

http://groundviews.org/2014/08/07/mob-disrupts-meeting-of-families-of-disappeared-police-government-hound-participants/

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 7. “මානව හිමිකම් ආරක්ෂකයින්ට වෙඩි තබා නරින්ට කෑමට කැලේට වීසි කළ යුතුයි” – පුවත්පතක් වාර්තා කරයි

2014 අගෝස්තු 10 වන දින දිවයින පුවත්පතෙහි පළ වූ ලිපියක "නරි ගතිය" ජානගතව බිහිවූවාක් මෙන් රඟන අමන රැලක් වන මානව හිමිකම් ක්‍රියාකාරී ලේබලය අලවා ගත් එවුන්ට වෙඩි තබා සැබෑ නරින්ට අනුභව කරන්නට කැලේට වීසි කළ යුතු බව දැක්විණි. “විලි වසා ගැනීමට ඇති අමුඩ ලෙන්සුව ගෙන "මානව හිමිකම් ක්‍රියාකාරී" ලෙස ලේබලයක් අලවා කරට දමාගෙන ඇති බව එම පුවත්පතේ තව දුරටත් වාර්තා විය. “විජාතික ඩොලර් පොට්ටනි දෙස බලා රාජ්‍ය නොවන සංවිධාන ලෙසින් පෙනී සිට රඟන නිරුවත් නරි නාඩගමද සුළුපටු එකක් නොවෙති.” යාපනය පුවත්පත්කරුවන්ගේ සංගමයේ සම්බන්ධීකාරක දයාබරන් මහතා ත්‍රස්තවාදියෙකු සහ 5දෙනෙකුට මරණට කැදවූ බෝම්බ ප්‍රහාරයට වගකිව යුතු බවට මේ ලිපියෙන් චෝදනා කළේය. (දයාබරන් මහතා 2014 ජූලි මාසයේදී දෙමල ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් පැවැත්වුණු පුහුණු වැඩමුළුවක් සංවිධානය කිරීමට සහය ලබා දී ඇති අතර මැර කණ්ඩායමක් විසින් එය කඩාකප්පල් කිරීමෙන් පසු යාපනය ඇතුළු උතරු පළාත් වල අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස් පිළිබද ප්‍රසිද්ධ නිවේදනයක් නිකුත් කළේය.) මානව හිමිකම් ආරක්ෂකයෙකු වන ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය අපකීර්තියට පත් කිරීම අරමුණු කර ගත් මෙම ලිපිය ජිනීවා නුවරට තොරතුරු යවන බවට නීතිඥ J. C. වැලඅමුණ, රුකී ප්‍රනාන්දු, බ්‍රිටෝ ප්‍රනාන්දු සහ සතිවේල් පියතුමා වැනි මානව හිමිකම් ආරක්ෂකයින් ට චෝදනා කළේය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබද හිටපු මහකොමසාරිස්වරිය එල්.ටී.ටී.ඊ සංවිධානයේ ගෞරවයට පාත්‍ර වූ බව සහ රාජ්‍ය නොවන සංවිධාන වලට ඩොලර් සල්ලි ලබා දෙමින් “ඇමරිකානු තානාපති කාර්යාලය සමග තවත් බටහිර රටවල් දෙක තුනක තානාපති කාර්යාල රාජපක්ෂ රජය පෙරලා දැමීමේ මෙහෙයුමේ කොටස්කරුවන් වී සිටින” බව ලිපිය මගින් තව දුරටත් චෝදනා කළේය.

http://www.divaina.com/2014/08/10/feature21.html (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 8. රට අපකීර්තියට අරමුණු කර ගත් ජනමාධ්‍ය පුහුණු - පුවත්පතක්

දෙමළ ඩයසපෝරාව සහ බටහිර තානාපති කාර්යාල විශාල මුදලක් වැය කරමින් යාපන ප්‍රදේශයේ සිටින තෝරාගත් දෙමළ තරුණයන්ට ස්මාර්ට් ජංගම දුරකතන පවා ලබා දෙමින් සමාජ වෙබ් අඩවි උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාව අපකීර්තියට පත් කරන බව ජාතික සමගිය ගොඩනැගීමේ සංසදය නම් සංවිධානයක් විසින් චෝදනා කළ බව 2014 අගෝස්තු 1 වන දින රිවිර පුවත් පතේ ප්‍රවෘත්තියක් වාර්තා කළේය. මෙවැනි වැඩසටහනකට සහභාගී වූ යාපනය පුවත්පත්කරුවන්ගේ සංගමයේ සම්බන්ධීකාරක දයබරන් මහතා කොටි සාමාජිකයෙකු බව සහ කොටින්ගේ වෙබ් අඩවියක ඔහු සේවය කර ඇත බව එම පුවත්පත් වැඩිදුරටත් චෝදනා කළේය.

http://www.rivira.lk/epaper/daily/fri/2014/08/01/index.html#3/z (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 9. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහ බෞද්ධ භික්ෂුවකගෙන් රාජ්‍ය තාන්ත්‍රිකයන්ට අනතුරු හැඟවීම්

බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙයවන ලද මැර කණ්ඩායමක් විසින් කඩාකප්පල් කරන ලද අගෝස්තු 04 වන පැවැත්වුණු උතුරේ දෙමළ අතුරුදහන්වූවන්ගේ පවුල් වල හමුව සදහා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් කිහිපදෙනෙක් සහභාගී විය. තානාපති කාර්යාල කිහිපයක් මෙම සිදුවීම හෙලා දකිමින් ප්‍රසිද්ධ නිවේදනයක් ද නිකුත් කළහ. ශ්‍රී ලකාවේ විදේශ කටයුතු පිළිබද අමාත්‍යාංශය විසින් නිකුත් කළ නිල මාධ්‍ය නිවේදනය මෙම සිදුවීම හෙලා දැකීමෙන් වැළකී සිටි අතර ඇතැම් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් මධ්‍යස්ථභාවයෙන් තොරව යම් යම් ප්‍රජාවන්ට අදාල වැඩසටහන් වලට සම්බන්ධ වන බවට චෝදනා කළේය. ඔවුන්ගේ මෙම ක්‍රියාකාරකම් රටේ වැදගත් සනංධිස්ථානයක් වන මේ කාලයේදී ජාතීන් අතර විශ්වාසය කඩතොළුවී යමට හේතු වූ බව ද එහි සදහන් විය. මෙය, මානව හිමකම් කඩ වූ පුද්ගලයන්ට සහ මානව හිමිකම් ආරක්ෂකයින්ට සහය දීමෙන් වළකින ලෙස අමාත්‍යාංශය රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාවට කළ අනතුරු හැඟවීමක් බව පෙනෙන්නට තිබුණි. “රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව මෙවැනි චිත්තවේගාත්මක ස්වරූපයක් ගන්නා වැඩසටහන්වලට සහභාගී වීමේදී දේශීය සංවේදීතා පිළිබද දැනුවත්ව කටයුතු කළ යුතු බව අමාත්‍යාංශය තරයේ අවධාරණය කර සිටී” යනුවෙන් එම නිවේදනයේ සදහන් විය. හමුව කඩාකප්පල් කළ මැර කණ්ඩායම විසින් පුවත්පත් සාකච්ඡාවක් පවත්වා එම හමුවට සහභාගී වූ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන්ගෙන් ප්‍රශ්න කරන ලෙස බල කළහ.


විදේශ කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකාව
வெளிவிவகார அமைச்சு இலங்கை
Ministry of External Affairs Sri Lanka

Home Foreign Policy Media Consular Services Missions FAQ's Contact Us

External Affairs Ministry Statement on the Meeting at CSR on 4th August

The attention of the External Affairs Ministry has been drawn to an incident that occurred at the Centre for Society and Religion in Colombo on 4th August. According to reports, a meeting had been organized by the NGO "Right to Life Human Rights Centre" involving families of disappeared persons from the North. However, another NGO, the "Dead and Missing Person's Parents Front", had sought access to the meeting, demanding that their grievances be heard too. An ensuing argument had led to a tense situation which had subsequently been brought under control by law enforcement authorities. Several diplomatic representatives from western Missions based in Colombo had also been present at the event.

http://www.mea.gov.lk/index.php/en/component/content/article/1-latest-news/5065-external-affairs-ministry-statement-on-the-meeting-at-csr-on-4th-august (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

http://groundviews.org/2014/08/07/mob-disrupts-meeting-of-families-of-disappeared-police-government-hound-participants/

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 10. අන්තවාදී බෞද්ධ කණ්ඩායමක් විසින් පාප්තුමාගේ සංචාරයට විරෝධය දක්වයි

2015 ජනවාරි මාසයේදී සිදු වීමට නියමිතව ඇති ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ අන්තවාදී බෞද්ධ කණ්ඩායමක් විසින් විරෝධය දක්වා ඇත. එතුමා, මානව හිමිකම් කඩ වූ පුද්ගලයන් වෙත සිය සහයෝගය පල කිරීමට සහ මානව හිමිකම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී කතෝලික ආගමික නායකයන් ඝාතන කිරීම් සහ අතුරුදහන් කිරීම් මෙන්ම ඔවුන් වෙත එල්ල වූ, තර්ජන සහ ප්‍රහාර ඇතුළු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමට ප්‍රවණත්වයක් පැවතීම මෙම විරෝධතා වලට හේතු වී ඇති බව විශ්වාස කෙරේ.

http://vaticaninsider.lastampa.it/en/world-news/detail/articolo/sri-lanka-sri-lanka-sri-lanka-35681/ (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 11. ජාතිවාදී කොළහලයේ සැකකරුවන් නිදහස්කිරීම ප්‍රතික්ෂේප කළ ජ්‍යෝෂ්ට පොලිස් නිලධාරියාට මරණ තර්ජන

2014 ජූනි මාසයේදී අළුත්ගම ප්‍රදේශයේදී ඇති වූ මුස්ලිම් විරෝධී කෝළහලය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සිංහල ජාතික සැක කරුවන් 13 දෙනා නිදහස් කිරීම ප්‍රකිත්ෂේප කළ නියෝජ්‍ය පොලිස්පති ඉන්ද්‍රන් මහතාගේ ජීවිතයට දරුණු තර්ජන එල්ල වී ඇති බව බීබීසි සිංහල සේවය වාර්තා කළේය. කළුතර සහ පානදුර පොලිස් වසමේ ප්‍රධානියා ලෙස කටයුතු කළ නියෝජ්‍ය පොලිස්පති ඉන්ද්‍රාන් මහතා මෙම කෝලහල වලින් පසුව අගෝස්තු මාසයේ සිට පොලිස් මූලස්ථානයේ සුභ සාධක කටයුතු පිළිබඳ ප්‍රධානියා ලෙස මාරු කර යවා ඇත.

http://srilankabrief.org/2014/08/dig-who-opposed-releasing-anti-muslim-rioters-received-death-threats/

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 12. පෝස්ටර් ව්‍යාපාරයක් හරහා ප්‍රධානපෙළේ මානව හිමිකම් ආරෂකයින් දෙදෙනෙකුට තර්ජන

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ආරක්ෂකයන් දෙදෙනෙකු වන ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු සහ සුනිල් ජයසේකර මහතාගේ දුරකතන අංක ඇතුළත් බලු පැටවුන් විකිණීමට ඇති බව දැක්වෙන පොස්ටර් කොටුව දුම්රිය ස්ථානය අවට

ප්‍රදේශවල අලවා තිබුණි. ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය ජපානයෙහි පදනම් වී ඇති 'සියළු ආකාරයේ වෙනස් කොට සැළකීම් සහ වර්වාදය පිටු දැකීමේ ව්‍යාපාරයේ' (IMADR) සභාපතිනිය වන අතර සුනිල් ජයාස්කර මහතා මාධ්‍ය නිදහසේ මුරපල්ලා වන නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැදවුම්කරු වේ. මේ දෙදෙනාම සෘජුව කතා කරන ප්‍රකට මානව හිමිකම් ආරක්ෂකයින් වන අතර ඔවුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් මේ දෙදෙනාම නොයෙකුත් තර්ජන සහ අපකීර්තියට ලක් කිරීම් වලට ලක් වූහ.

http://srilankabrief.org/2014/08/puppies-for-sale-poster-campaign-to-intimidate-hrds/ (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)








මානව හිමිකම් ආරක්ෂකයින් වන ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු සහ සුනිල් ජයසේකර මහතාගේ දුරකතන අංක ඇතුළත් පෝස්ටරය

(Photo: SriLanka Brief)

## B. මානව හිමිකම් ආරක්ෂකයින් ප්‍රශ්ණ කිරීම

### 13. පශ්චාත් යුධ සංවර්ධනය පිළිබඳ වූ ජාත්‍යන්තර සමුළුවකට සහභාගී වූ පුද්ගලයෙකුගෙන් ප්‍රශ්ණ කිරීම

නැගෙනහිර පළාතේ මඩකළපුව ප්‍රදේශයේ සංචාරය කරමින් සිටි විද්වත් - ක්‍රියාකාරිකයෙකු පොලීසියේ ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් රදවා තබා ගෙන ප්‍රශ්න කරන ලදී. ප්‍රථම වතාවට ඔහුගෙන් ප්‍රශ්න කර ඇත්තේ 2014 අගෝස්තු 28 වන දින ඔහු ගම්මානයක් බැලීමට ගිය අතරතුරේය. අගෝස්තු 29 වන දා මඩකළපුවේදී නැවත ඔහුගෙන් ප්‍රශ්න කර ඇත. පසුව කොළඹට කැදවා ගෙන විත් අගොස්තු 30 වන දා දක්වා ප්‍රශ්න කර ඇත. මොහු ශ්‍රී ලංකාවට පැමිණ සිටියේ පශ්චාත් යුළ සංවර්ධවය පිළිබද වූ ජාත්‍යන්තර සමුළුවකට සහභාගී වීමට වූ අතර ඒ සදහා වූ නිල වීසා පතක්ද ඔහු සතුව විය. ඔහු මඩකළපුවට ගොස් ඇත්තේ සමුළුවට පෙර පශ්චාත් යුධ සමයේ සැබෑ තත්ත්වය පිළිබද දැන ගැනීමටයි. ඔහුට මඩකළපුවේදී සහය දුන් ප්‍රාදේශීය ක්‍රියාකාරිකයෙකුගේ නිවසට පැමිණි පොලිසි නිලධාරීන් ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබද ප්‍රශ්න කර ඇත.

### 14. යාපනය ජනමාධ්‍ය සමාජයේ සම්බන්ධීකාරක වරයාගෙන් ප්‍රශ්න කරයි

2014 අගෝස්තු 04 වන දා යාපනය ජනමාධ්‍ය සමාජයේ සම්බන්ධීකාරකවරයා වන දයාබරන් මහතාං ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් ප්‍රශ්න කරන ලදී. දෙමළ ජනමාධ්‍ය වේදීන් සදහා 2014 ජූලි මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ පුහුණු වැඩමුළුවක් සංවිධානය කිරීමෙහිලා පෙරමුණ ගත්තේ යාපනය ජනමාධ්‍ය සමාජය සහ දයාබරන් මහතාය. එම වැඩමුළුව කිසියම් කණ්ඩායමකගේ තර්ජන හමුවේ අවලංගු කිරීමට සිදු විය. මේ සම්බන්ධයෙන් යාපනයේදී විරෝධතාවයක් සංවිධානය කිරීමටද දයාබරන් මහතා මැදිහත් විය. ඔහුගෙන් ඇසූ ප්‍රශ්න අතර මීට පෙර මැර කණ්ඩායමකගේ බලපෑම් මත නවතා දැමීමට සිදුවූ කොළඹ පැවැත්වීමට නියමිතව තිබූ වැඩමුළුව, පොලීසිය හා හමුදාව විසින් ඔහු ඇතුළු තවත් ජනමාධ්‍යවේදීන් මුර පොළකදී නතර කළ සිදුවීමක්, 2014 ජූලි 31 වන දා යාපනයේදී පැවති මාධ්‍ය නිදහස සදහා වූ විරෝධතාවයක් මෙන්ම 1998 යාපනයේ පුපුරා ගිය බෝම්බයක් පිළිබද ප්‍රශ්න විය.

## C. අදහස් ප්‍රකාශකිරීමේ නිදහස උල්ලංඝණය කිරීම

### 15. ජනමාධ්‍යවේදීන් සයදෙනෙක් ජිහාඩ් වරුන් ලෙස නම් කිරීම

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය වේදීන් සය දෙනෙකුං "වැදගත් මාධ්‍ය වේදීන් සහ ලේඛකයන්" වශයෙන් පෙනී සිටින "සිංහල විරෝධී සහ බෞද්ධ විරෝධී ජිහිඩ් වරුන් " ලෙස නම් කරමින් බෙදා හැරුණු නම් රහිත ඉ මේල් පණිවුඩයක් පිළිබඳව ජනමාධ්‍ය වාර්තා කළේය. මෙහි සඳහන් වූ සියළුම ජනමාධ්‍ය වේදීන් මුස්ලිම් ජාතියන් වන අතර ඒ අතර ප්‍රමුඛ ඉංග්‍රීසි පුවත් පත් වන ඩේලි මිරර් සහ සිලෝන් ටුඩේ වෙනුවෙන් සේවය කරන ජනමාධ්‍යවේදියන් සහ නීතිඥවරියක් ද විය. මාධ්‍ය වාර්තාවට අනුව මෙම ජනමාධ්‍යවේදීන් දරා ගැනීමට අපහසු සත්‍ය වසන් කරමින් බොරු කියන බවත්, සිංහල බෞද්ධයන් නියෝජනය කරන සංවිධාන සහ ඒවායේ නායකන් පිළිබඳ තීන්දු දෙන කැන්ගරු උසාවි විනිසුරුවරුන්ගේ භූමිකාව අතට ගැනීමට තරම් දුර යන බවත් එම ඉ මේල් පණිවුඩය චෝදනා කර ඇත. මෙ පුද්ගලයන් යොදා ගන්නා ක්‍රමවේදය වන්නේ ඔවුන්ට අවශ්‍ය දේ පමණක් මහජනයා වෙතට යැමට සැළැස්වීමත් එය සත්‍යයක් වන තුරු නැවත නැවත ප්‍රකාශ කිරීමය යනුවෙන් ද එහි සඳහන් වී තිබුණි. (නැවත නැවත ප්‍රකාශ කිරීම සඳහා ප්‍රතිස්ථම්භණය කිරීම, නාසි මාධ්‍ය අමාත්‍යවරයා වූ ජෝසප් ගොබෙල් ඉතා සාර්ථකය යොදා ගත් කුප්‍රකට ප්‍රචාරණ ක්‍රමයයි. )

http://www.nation.lk/edition/lens/item/31677-the-jihadi-journalists-of-sri-lanka.html (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 16. වවුනියාවේ දෙමල ජනමාධ්‍යවේදියෙකුට මරණ තර්ජන



මාධ්‍ය වාර්තාවලට අනුව වවුනියාවේ ජනමාධ්‍යවේදියෙකු වන නවරත්තිනම් කපිලනාත් මහතාට 2014 අගෝස්තු 2 වන දින දුරකතනය ඔස්සේ මරණ තර්ජන එල්ල වී තිබේ. එහිදී ඔහු සහ යාපනයේ ඔහුගේ ජනමාධ්‍ය සගයන්ව මරා දමන බවට තර්ජනය කර ඇත. පොලීසිය වෙත පැමිණිළි කරන බව කපිලනාත් පැවසූ පසු " උඹ අපිව දන්නේ නෑ, පොලීසියට අපි ගැන පැමිණිළි කළොත් උඹ ජීවත් වෙන්නේ නෑ" යනුවෙන් නිර්නාමික අමතන්නා පවසා ඇත.

නවරත්නම් කපිලනාත් (Face book photo)

http://www.tamilguardian.com/print.asp?articleid=11724

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 17. නිව්යෝක් ටයිම්ස් ජනමාධ්‍යවේදියාට වීසා නිකුත් කිරීම ප්‍රමාද කරයි

2014 ජූනි මාසයේදී මුස්ලිම් විරෝධී කැරලි හටගත් අළුත්ගම හා සම්බන්ධ සිදුවීම් ඇතුළු ඇතැම් දේශීය සිදුවීම පිළිබඳව වාර්තා කිරීමට ශ්‍රී ලංකාවට පැමිණීමට වීසා ඉල්ලා සිටි නිව්යෝක් ටයිම්ස් හි දකුණු ආසියානු වාර්තාකරු වන ගාඩිනර් හැරිස් හට වීසා නිකුත් කිරීම ලංකාන්ඩුව ප්‍රමාද කර ඇත. "ඔහුගේ පැමිණීම අනුමත කිරීමට මෙය කාලය නොවේ" යනුවෙන් මෙම වීසා ප්‍රතික්ෂේප කිරීම විදේශ කටයුතු පිළිබද අමාත්‍යංශ ප්‍රකාශක විසින් තහවුරු කර ඇති බව 2014 අගෝස්තු මස 24 වන දා මාධ්‍ය වාර්තා කළේය. තමා ශ්‍රී ලංකාවට පැමිණීමට වීසා අයදුම් කර ඇති බව ගාඩිනර් 2014 ජූනි මාසයේ ට්විටර් පණිවුඩයක් මගින් ප්‍රකාශ කළේය.

http://www.thesundayleader.lk/2014/08/24/visa-on-hold-for-us-journo/ (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 18. දෙමළ බසින් ජාතික ගීය ගායනා කිරීම පිළිබද පරීක්ෂණයක්

දෙමටගොඩ විපුලානන්ද දෙමළ පාසලේදී ජාතික ගීය දෙමළ බසින් ගායනා කර ඇති බව වාර්තා වීමෙන් පසුව ඒ සම්බන්ධ පරීක්ෂණයක් පවත්වන ලෙසටත් නිසි පියවර ගන්නා ලෙසටත් කොළඹ දිසා ලේකම් වරයා විසින් කොළඹ පළාත් අධ්‍යාපන

අධ්‍යක්ෂවරයාට ලිපියක් මගින් නියෝග කර ඇත. ශ්‍රී ලංකා ගුරු සංගමයට අනුව ප්‍රදේශයේ සිවිල් ආරක්ෂ කමිටුවකදී ජාතික ගීය ගායනා කිරීම පිළිබඳ ප්‍රශ්නය පැණ නැගී ඇත. ජාතික ගීය දෙමළ බසින් ගායනා කිරීම හේතුවෙන් දෙමළ පාසල්හි විදුහල්පතිවරුන්ට අඩන්තේට්ටම් කිරීම වැළැක්වීමට පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා ගුරු සංගමය විසින් ජාතික භාෂා සහ ඒකාබද්ධතා අමාත්‍යවරයාගෙන් ඉල්ලා ඇත. සිංහල සහ දෙමල භාෂා දෙකම ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා බවත් ජාතික ගීයේ දෙමළ අනුවාදය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් වන බවත් දෙමළ බසින් ජාතික ගීය ගායනා කිරීම දෙමළ පාසල් වල සිරිතක් බවත් ශ්‍රී ලංකා ගුරු සංගමය පෙන්වා දී ඇත.

http://sinhala.lankanewsweb.net/news/13578-2014-08-24-09-21-41 (Sinhalese) (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 19. අධිකරණ පටිපාටි වාර්ථා කිරීමට මාධ්‍යයට අවහිරතා

පොලීසිය විසින් ගල්කිස්ස දිස්ත්‍රික් අධිකරණය වාර්තා කිරීම නැවත වතාවක් මාධ්‍යයට තහනම් කරන ලදී. ඒ ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සම්බන්ධ නඩුවකදී ඔහුගෙන් හරස් ප්‍රශ්න විමසන අවස්ථාවේදීය. 2007 වසරේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් සිදු කළ මතභේදයට තුඩු දුන් මිග් 29 යානාවක් මිලදී ගැනීම සම්බන්ධයෙන් කරුණු හෙළිදරව් කළ ලිපියක් පිළිබඳව ද සන්ඩේ ලීඩර් පුවත් පතට විරුද්ධව රාජපක්ෂ මහා විසින් මේ නඩුව ගොනු කර ඇත. අධිකරණ පටිපාටි මහජනයාට විවෘත වන අතර එවන් නඩු විභාග වාර්තා කිරීමට ජනමාධ්‍යවේදීන් දිනපතාම අධිකරණය වෙත පැමිණේ. පසුගිය මැයි මාසයේදී අදාල නඩුව සඳහා ගෝඨාභය රාජපක්ෂ මහතා සාක්ෂි දුන් අවස්ථාවේදී ද අධිකරණය වාර්තා කිරීම ජනමාධ්‍යවේදීන්ට තහනම් කරන ලදී.

https://www.colombotelegraph.com/index.php/press-barred-again-from-covering-gotabayas-cross-examination-in-court/

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

# D. සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම

## 20. අතුරුදහන් වූවන්ගේ පවුල් වල හමුවකට බෞද්ධ භික්ෂුවක් විසින් මෙහෙයවූ මැරකණ්ඩායමක් කඩාවදී

මිය ගිය සහ අතුරුදහන්වූවන්ගේ දෙමාපිය පෙරමුණ යන නමින් පසුව තමන්ව හඳුන්වා ගත් බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙයවනු ලැබූ මැර කණ්ඩායමක් උතුරු පළාතේ සිට පැමිණි දෙමළ අතුරුදහන්වූවන්ගේ පවුල්හි හමුවකට කඩා වැදී සාකච්ඡාව නවත්වන ලෙස බල කර සිටියේය. මේ අවස්ථාවේදී සංවිධායකයින් විසින් පොලීසිය කැඳවූවද හමුව සහ එයට සහභාගී වූවන් වෙත ආරක්ෂාව තහවුරු කිරීම පොලීසිය ප්‍රතික්ෂේප කරන ලදී. මුලදී මැර කණ්ඩායම විසුරුවා හැරීම පොලීසිය ප්‍රතික්ෂේප කර ඇති අතර පොලීසිය ක්‍රියාත්ම වී ඇත්තේ සංවිධායකයින්ගේ සහ සහභාගීවූවන්ගේ ඇඩි ඉල්ලීම මත පමණි. එහි මැර කණ්ඩායම මෙහි සංවිධායකයින් සහ සහභාගී වූවන් එල්.ටී.ටී.ඊ හවුල් කරුවන් බවට හංවඩු ගසමින් ජාත්‍යන්තර යුධ අපරාධ පරීක්ෂණයක් සඳහා සහය දීම මගින් රජය අපකීර්තියට පත් කිරීමට මොවුන් උත්සහ කරන බවට අසභ්‍ය සහ අසත්‍ය දෝෂාරෝපණ එල්ල කළේය. සහභාගීවූ පිරිස මිය ගිය එල්.ටී.ටී.ඊ සාමාජිකයන්ගේ පවුල් බව සමාජ හා සාමයික කේන්ද්‍රයේ පැවති මෙම හමුවට කඩා වැදි මැර කණ්ඩායමේ සිටි බෞද්ධ භික්ෂුවක් ප්‍රකාශ කළේය. මෙම හමුව සංවිධානය කළ සහ එහි මූලිකත්වය ගන්නා පුද්ගලයන් ත්‍රස්තවාදීන් බව ද මෙය රහසිගත තිත්පොළක පැවති නීති විරෝධී හමුවක් බවද හෙතෙම තව දුරටත් ප්‍රකාශ කළේය. රටට විරුද්ධ වන පුද්ගලයන්ට පහර දී එළවා දැමීමට ඉන්පසු ඔහු මහජනතාවට ආරාධනා කළේය. රාජ්‍ය ද්‍රෝහීන්ට ජීවත් වීමට ඉඩ නොතැබිය යුතු බවත් ද්‍රෝහීන්ට දිය යුතු දඬුවම එල්ලා මැරීම නම් එය නීති ගත කිරීමට පියවර ගන්නා ලෙස රජයට දැනුම් දන්නේය.

http://groundviews.org/2014/08/07/mob-disrupts-meeting-of-families-of-disappeared-police-government-hound-participants/

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 21. කොළඹ පැවැත්වෙන රැස්වීම් වලට සහභාගී නොවන ලෙස උතුරේ දෙමල අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් වලට තර්ජන

අගෝස්තු 03 වන දින නාඳුනන පුද්ගලයෙකුගෙන් තමන්ට තර්ජනාත්මක දුරකතන ඇමතුමක් ලැබුණු බව සහ තමා රැස්වීමක් සඳහා කොළඹ බලා යාමට නියමිත බව ඔවුන් දන්නා බව පැවසූ බව දක්වමින් අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ මවක් පැවසීය. රැස්වීමට දින කිහිපයකට පෙර තවත් මව් වරුන් කිහිප දෙනෙක් වෙතද එවැනි නාඳුනන දුරකතන ඇමතුම් ලැබී තිබුණි. ඇතැම්

දුරකතන ඇමතුම් වලින් කියැවී ඇත්තේ ඔවුන් අපරාධ පරීක්ෂණ අංශයෙන් බවත්, ඔවුන් යන එන ස්ථාන පිළිබඳ විමසීම සඳහා මේ ඇමතුම් ලබා දුන් බවත්, දැනුම් දෙන ලද ස්ථානයකදී ඔවුන්ව හමු වීමට පැමිණෙන ලෙසත් ය. රැස්වීමට දින කිහිපයකට පෙර තවත් මවකගේ නිවස ඉදිරිපිට බුද්ධි අංශ නිලධාරීන් ගැවසී ඇති අතර ඇය රැස්වීම සඳහා පිටත් වීමට පෙර ඔවුන් ඇයට තර්ජනය කර ඇත. රැස්වීමට දින කිහිපයකට පෙර ඇයට ද නාඳුනන පුද්ගලයන්ගෙන් දුරකතන ඇමතුම් ලැබී ඇත. අගෝස්තු 4 වන දින කොළඹදී පැවැත්වුණු අතුරුදහන්වූවන්ගේ පවුල් හමුව සංවිධානය කිරීමට දායක වූ උතුරු පළාතේ ජීවත් වන පුද්ගලයෙකුට ද අගෝස්තු 03 වන දා නාඳුනන පුද්ගලයෙකුගෙන් තර්ජනාත්මක දුරකතන ඇමතුමක් ලැබී ඇත. කොළඹ පැවැත්වෙන රැස්වීමට අගෝස්තු 03 වන දින රාත්‍රියේ අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් රැගෙන යනවාදැයි ඔහුගෙන් ඔවුන් ප්‍රශ්න කර ඇත.



බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙයවූ මැර කණ්ඩායමක් විසින් අසරණ කළ දෙමළ සහභාගීවන්නන් (©Melani Manel Perera)

අගෝස්තු 4 වන දින තමා කොළඹ පැමිණි අවස්ථාවේ උතුරේ පිහිටි තමන්ගේ නිවස ට බුද්ධි අංශ නිලධාරීන් පැමිණ තමා පිළිබඳ ප්‍රශ්ණ කර ඇතැයි තවත් මවක් පැමිණිළි කළේය. රැස්වීම පැවැත්වීමට මාසයකට පමණ පෙර සිටම මේ මව්වරුන්ට නාඳුනන දුරකතන ඇමතුම් ලැබී ඇත.

http://groundviews.org/2014/08/07/mob-disrupts-meeting-of-families-of-disappeared-police-government-hound-participants

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 22. හමුව විසුරුවා හැරීමෙන් පසුව අතුරුදහන් වූවන්ගේ පවුල් පොලීසියේ නිරීක්ෂණයට

ඉහත සඳහන් කළ හමුව විසුරුවා හැරීමෙන් පසුව, දෙමළ අතුරුදහන්වූවන්ගේ පවුල්හි සාමාජිකයන් එම ස්ථානයේ තව දුරටත් රැඳී සිටිනවාදැයි සොයා බැලීමට එදින රාත්‍රියේ පොලීසිය එම ස්ථානයට පැමිණ ඇත. උතුරේ සිට පැමිණි දෙමළ පවුල්වලට රාත්‍රී නවාතැන් ගැනීමට සූදානම් කර තිබූ ක්‍රිස්තියානි මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයෙන්ද පොලීසිය ප්‍රශ්න කර ඇත. කෙසේ වුවත් හමුව සඳහා පැමිණි පිරිස වර්ධනය වූ බියජනක පරිසරය තුළ සිය ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා එදින සවසම සිය නිවෙස් බලා පිටත් වීමට තීරණය කළහ.

http://groundviews.org/2014/08/07/mob-disrupts-meeting-of-families-of-disappeared-police-government-hound-participants/

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 23. බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම් වල වින්දිතයින් පිළිබඳ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් පැවත් විරෝධතා ව්‍යාපාරයට පොලීසියෙන් අවහිරතා



2014 අගෝස්තු 30 වන දින පැවති සාමකාමී රැලිය පොලීසිය විසින් අවහිර කිරීම (© Melani Manel Perera)

අගෝස්තු 14 වන දින අතුරුදහන් වූවන්ගේ පවුල් වල සාමාජිකයන්, විපක්ෂ දේශපාලඥයින්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ පූජ්‍ය පක්ෂය එක්ව රජයේ නියෝජිතයෙකු වෙත පෙත්සමක් භාර දීමට ගමන් කරමින් සිටි රැලිය පොලීසිය විසින් අවහිර කළ බව වාර්තා විය. වවුනියාව නගර සභා ශාලාවේ පැවති මහජන හමුවකින් අනතුරුව මෙම සාමකාමී රැලිය ආරම්භ වී ඇත.

http://tamilnet.com/art.html?catid=13&artid=37363 (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 24. අන්තර් ආගමික සහයෝගීතා වැඩසටහන් හමුදාවේ පරීක්ෂාවට

ජාතික සාම මණ්ඩලය විසින් සංවිධානය කළ අන්තර් ආගමික සංහයෝගීතා වැඩසටහන් ආරක්ෂ හමුදාවන්ගේ සහ පොලීසියේ පරීක්ෂණයට ලක් වී ඇති බව එහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය ජෙහාන් පෙරේරා වාර්තා කළේය. යුද්ධය පැවති ප්‍රදේශ වලින් පිටත පැවැත්වුණු වැඩසටහන් දෙකක් ද මෙලෙස පරීක්ෂාවට ලක් වී ඇති අතර මර්දනය කිරීමේ සම්ප්‍රදාය රටේ සියළුම පළාත් ගිල ගෙන ඇති බව ආචාර්ය පෙරේරා තවදුරටත් කියා සිටියේය. මහනුවර ප්‍රමුඛ පෙළේ ක්‍රියාකාරී සිවිල් සමාජ සංවිධානයකට අයත් ශාලාවක් තුළ පැවැත්වෙමින් තිබුණු අන්තර් ආගමික සාකච්ඡාවට ඇතුළු වූ සිවිල් ඇඳුමින් සැරසුණු බුද්ධි අංශ නිලධාරීන් සාකච්ඡාව සටහන් කර ගෙන ඇත. සියළුම ප්‍රජාවන්ට අයත් දරුවන් සහ දෙමාපියන් ඒකරාශී කොට ගාල්ලේදී පැවැත්වුණු වැඩසටහනට ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට ද ආරාධනා කර තිබුණි. කෙසේ වෙතත් වැඩසටහන පරීක්ෂා කිරීමට තවත් පොලිසි කණ්ඩායමක් පැමිණ ඇත. නැගෙනහිර පළාතේ අඩලච්චේනෛහිදී පැවැත්වුණු තරුණ කඳවුර පිළිබඳ ප්‍රදේශයේ පොලීසිය සහ රජයේ නිලධාරීන් දැනුවත් කර තිබුණ අතර ඔවුන් ආරම්භක උත්සවයටද සහභාගී වී ඇත. ඔවුනගේ පැමිණීම නොසලකා නිල ඇඳුම් රහිත අවි ගත් ආරක්ෂක හමුදා නිලධාරීන් දින දෙකක් තුළ අවස්ථා තුනකදී වැඩසටහනේ සංවිධායකයන් ගෙන් ප්‍රශ්න කර තිබේ. අගෝස්තු 25 වන සඳුදා මඩකළපුවේදී තරුණයන් විසින් සංවිධානය කළ සංස්කෘතික වටිනාකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන පිළිබඳව ආරක්ෂක හමුදා නිලධාරීන් දෙදෙනෙකු විසින් ප්‍රශ්න කර ඇත. යනුවෙන් ආචාර්ය පෙරේරා ප්‍රකාශ කළේය.

http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=109117

(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## 25. විරෝධතා පවත්වන දෙමළ දේශපාලන සිරකරුවන්ගේ දෙමව්පියන්ට අනතුරු හැඟවීම්

උපවාසයක නිරත වී සිටින දෙමළ දේශපාලන සිරකරුවන් තිදෙනෙකුගේ දෙමාපියන්ට ඔවුන්ව බැලීමට යාමට ඉඩ ලබා දී නොමැති අතර උපවාසෙයන් ඔවුන් මියගිය හොත් ඔවුන්ගේ මළසිරුරු පමණක් දැක ගත හැකි වනු ඇති බවට අනතුරු හගවා ඇති බව "Gobal Tamil News" වාර්තාකර තිබුණි. මෙම දෙමල දේශපාලන සිරකරුවන් වසර 6ක් තිස්සේ අනුරාධපුරයේ රඳවා ඇති අතර ඔවුන් පිළිබඳ කිසිදු චෝදනා ගොනු කිරීමක් මෙතෙක් සිදු කර නොමැත. සෙසු දෙමළ සිර කරුවන් රඳවා සිටින සිර කදවුරට තමන්ව මාරු කර යවන ලෙසට බල කරමින් මොවුන් මෙම උපවාසය ආරම්භ කර ඇත. සිංහල සිරකරුවන් තමන්ට හිරිහර කරන බවත් කෑම සලාකය පවා පැහැර ගන්නා බවත් මේ සිරකරුවන් තිදෙනා පැමිණිළි කර ඇත.
http://srilankabrief.org/2014/08/parents-told-to-wait-to-see-the-dead-bodies-of-3-tamil-prisoners/#more-19696
(අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 26. රජයට සහය දෙන කණ්ඩායමක් විසින් වෘත්තීය සමිති රැස්වීම් කඩාකප්පල් කරයි

රජයට පක්ෂපාතී වෘත්තීය සමිතියක් වන නිදහස් සේවක සංගමය විසින් වෘත්තීය සමිති එකමුතුව මගින් 2014 අගෝස්තු 27 වන දින සංවිධානය කළ දැනුවත් කිරීමේ රැස්වීමක් කඩාකප්පල් කර සහභාගී වූවන්ට පහර දුන් බව රජයේ මුද්‍රණාල වෘත්තීය සමිතියේ ප්‍රකාශක කියා සිටියේය. මාධ්‍ය වාර්තා වලට අනුව වෘත්ති සමිති එකමුතුවේ සාමාජිකයින් ජනතා විමුක්ති පෙරමුණේ සහ එක්සත් ජාතික පක්ෂයේ හිතවතුන්ය. රජයේ මුද්‍රණාලයට දේශපාලන පත්වීම් ලබා දී ඇති අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඌව පළාත් සභා මැතිවරණය සඳහා අවශ්‍ය ප්‍රචාරණ මුද්‍රණ කටයුතු මේ හරහා සිදු කර ගන්නා බවට ඔව්හු චෝදනා කළහ.
http://www.hirunews.lk/90491/tense-situation-at-government-press (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 27. වැඩ වර්ජනයට වාරණ නියෝගයක්

රජයේ රෝහල් වල ක්‍රියාකාරිත්වයට බලපෑම් ඇති කළ සෞඛ්‍ය අනධ්‍යන කාර්ය මණ්ඩල වැඩ වර්ජනය සම්බන්ධයෙන් රෝගියෙකු විසින් ඉදිරිපත් කළ පෙත්සමක් හේතුවෙන් 2014 අගෝස්තු 29 වන දින කොළඹ දිස්ත්‍රික් අධිකරණය විසින් තහනම් නියෝගයක් නිකුත් කළ බව මාධ්‍ය වාර්තා කළේය.
**http://www.hirunews.lk/90700/enjoining-order-issued-on-paramedics-strike** (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## E. සංවිධාන ගත වීමේ නිදහස උල්ලංඝණය කිරීම් (රාජ්‍ය නොවන සංවිධාන වලට තර්ජන සහ සීමා)

### 28. රාජ්‍ය නොවන සංවිධාන වලින් එල්ල වන තර්ජන රජය හඳුනා ගනී

නියාමනයකින් තොරව ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන සංවර්ධනය, නීතිය සහ සාමය ඇතුළු රටේ මූල්‍ය කළමණාකරණයට තර්ජනයක් වී ඇති බව ආරක්ෂාව පිළිබද දේශනයක් පවත්වමින් මුදල් අමාත්‍යාංශ ලේකම් P.B. ජයසුන්දර මහතා ප්‍රකාශ කළේය.
http://colombogazette.com/2014/08/18/government-notes-threat-from-ngos/ (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 29. පදනම් සහ ලාභ නොලබන ආයතන නිරීක්ෂණයට සහ පාලනයට නව නීති

ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය මගින් කෙටුම්පත් කෙරෙමින් පවතින නව නීති හරහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබද ලේකම් කාර්යාලය, පාර්ලිමේන්තුවේ පෞද්ගලික මන්ත්‍රී කෙටුම්පත් හරහා ලියාපදිංචි කර ඇති පදනම් නිරීක්ෂණය කෙරෙනු ඇති බව සන්ඩේ ටයිම්ස් පුවත්පත වාර්තා කළේය. මෙම නීති, ලියා පදිංචි කරන සමාගම්, භාරකාර මණ්ඩල සහ ඇතැම් සමිති ආකාරයෙන් ලියාපදිංචි වී සිටින ලාබ නොලබන ආයතන පාලනය කිරීමටද යොදා ගනු ඇති බව වාර්තා විය. යෝජනා වී ඇති නව නීති වලට අනුව රාජ්‍ය නොවන සංවිධාන පිළිබද ලේකම් කාර්යාලයේ ලිංයාපදිංචි නොකරන සංවිධාන වලට විදේශ ආධාර ලබා ගැනීමට සහ දේශීය වශයෙන් මුදල් හුවමාරු කිරීමට ඇති අයිතිය අහිමි වන බව රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ සමන් දිසානායක මහතා කියා සිටියේය. "ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබදව සෑම මාස 3කට වරක්ම අපි වෙත වාර්ථාවක් ලබා දිය යුතුය. එසේම ඔවුන්ටද එන්ජීඕ මෙන් අප සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට සිදු වනු ඇත. එමෙන්ම මෙම ආයතන වල ලිංයාපදිංචිය සෑම වසරකදීම අළුත් කිරීමට සිදු වනු ඇත.

http://sundaytimes.lk/140831/news/after-ngos-foundations-to-come-under-watch-115994.html (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

### 30. ලිංගික සේවය නීතිගත කිරීමට ජාත්‍යන්තර සංවිධාන බල කරන බවට අමාත්‍යවරයා චෝදනා කරයි

විදේශීය රටවල් මත යැපෙන ජාත්‍යන්තර සංවිධාන ලිංගික වෘත්තිය නීතිගතකිරීමට බලකරන බව ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍ය තිස්ස කරලියද්ද මහතා ප්‍රකාශ කර ඇති බව වාර්තා වේ. “කාන්තාවන් පිළිබද කතා කිරීමේදී කුඩා ගැටළුවක් ඇත. ජාත්‍යන්තර සංවිධාන වෙනුවෙන් සේවය කරන කාන්තාවන් සුළු ප්‍රමාණයක් සිටිනවා. ඔවුන් තානාපති කාර්යාල වලින් අසන්නේ මෙම තනතුරු ලබා දීමට ඔවුන්ගේ රටවල් වල කන්තාවන් නැද්ද යන්නයි.” යනුවෙන් හෙතෙම තව දුරටත් පැවසීය.

http://www.lankasrinews.com/view.php?22IMM303lOo4e2BmAca25YAdd3Y5fac3mBJe43Oln0236A43 (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

## F. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

### 31. වාර්ගික අසමගිය අවුළුවන බවට ශිෂ්‍ය සංගමයට සහ දේශපාලන පක්ෂයකට චෝදනා

අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය සහ පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් ශිෂ්‍යයන් අතර වාර්ගික අසමගිය අවුළුවන බව උසස් අධ්‍යාපන අමාත්‍ය S. B. දිසානායක මහතා චෝදනා කළ බව මානව හිමිකම් සුරුකීමේ ශිෂ්‍ය ව්‍යාපාරය ප්‍රකාශ කළේය. අමාත්‍ය වරයා මෙම ප්‍රකාශය සිදු කර ඇතිතේ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති යටතේ සබරගමුව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මතු වූ සිදුවීමේදීය. එක් ශිෂ්‍යයෙයකු අත්අඩංගුවට ගනු ලැබුවේ මැර ප්‍රහාරයකින් තුවාල ලබා සිටි අතරතුරය.

මූලාශ්‍රය: *“Monthly Update on Repression of Students in Sri Lanka – August 2014”, by Students for Human Rights*

### 32. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් පස් දෙනෙකු අත්අඩංගුවට

පීඨ කළමණාකාරීත්වය පිහිටුවන ලෙස බල කරමින් 2014 අගෝස්තු 21 වන දින පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යශිෂ්‍යාවන් උපවාසයක් ආරම්භ කළහ. 2014 අගේස්තු 20 වන දින උපවාසය සඳහා ශිෂ්‍යයන් විසින් කටයුතු සූදානම් කරමින් සිටි අතරතුරේදී එම ස්ථානයට පැමිණි පොලීසිය වාචික ප්‍රකාශ ලබා ගැනීම සඳහා පසු දින උදෑසන පොලීසියට පැමිණෙන ලෙස ශිෂ්‍යයන්ට දැනුම් දී ඇත. පොලීසියට පැමිණ වාචික ප්‍රකාශ ලබා දෙන මෙන් අගෝස්තු 21 වන දින ශිෂ්‍ය නායකයින් 5 දෙනෙකුට දැනුම් දී තිබුණි. අගේස්තු 22 වන දින ප්‍රකාශ ලබා දීමට පොලීසිය වෙත ගිය ශිෂ්‍ය නායකයින් තිදෙනෙක් අත්අඩංගුවට ගෙන මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. ඔවුන්ට ඉදිරිපත් කළ චෝදනා වූවේ නීති විරෝධී ඉදිරිකිරීම් සහ නීති විරෝධී ඇතුළු වීමය. දින 14ක් ශිෂ්‍යයන් රිමාන්ඩ් භාරයට පත් කිරීමට නියෝග කෙරුණි. අගෝස්තු 25 වන දින පොලීසිය වෙත ගිය තවත් ශිෂ්‍යයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඔවුන්ද රිමාන්ඩ් භාරයට පත් කර ඇත.

මූලාශ්‍රය : *“Monthly Update on Repression of Students in Sri Lanka – August 2014”, by Students for Human Rights*

### 33. විවෘත විශ්ව විද්‍යාල ශිෂ්‍ය නායකයින් සිවු දෙනෙකු ගේ පංති තහනම්

ශිෂ්‍ය සංගම් ගත වීමට ඇති අයිතිය ඉල්ලමින් 2014 අගෝස්තු 12 වන දින විවෘත විශ්ව විද්‍යාලය ඉදිරිපිට විරෝධතා ව්‍යාපාරයක මූලිකත්වය ගැනීම හේතුවෙන් එම විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය නායකයින් සිවු දෙනෙකුගේ පංති තහනම් කර ඇත. මේ සමග විවෘත විශ්ව විද්‍යාලයේ පංති තහනමට ලක් වූ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව 16 දක්වා ඉහළ ගොස් ඇත.

මූලාශ්‍රය: *“Monthly Update on Repression of Students in Sri Lanka – August 2014”, by Students for Human Rights*

## G. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

## 34. ඌව පළාත් සභා මැතිවරණයේදී විපක්ෂ දේශපාලන පක්ෂ වලට සමාන අවස්ථා අහිමි කිරීම

2014 සැප්තැම්බර් 20 වන දි ඌව පළාත් සභා මැතිවරණය පැවැත්විණි. පළ වූ විවිධ වාර්ථා වලට අනුව විපක්ෂයේ මැතිවරණ ප්‍රචාරණ කාර්යාල 50කට පමණ ප්‍රහාර එල්ල වී ඇත. "විපක්ෂ කාර්යාල වලට ගිණි තබා අවි ගත් මැර කණ්ඩායම් ඒවායින් පිටවී ගිය බව" වාර්ථා වූ බව කැෆේ ආයතනයේ විධායක අධ්‍යක්ෂ කීර්ති තෙන්නකෝන් මහතා ප්‍රකාශ කළේය. රාත්‍රී කාලයේ ගැවසුණු අවි ගත් කණ්ඩායම් හේතුවෙන් ප්‍රදේශයේ ආතතිය වර්ධනය වූ බව ඇතැම් දේශපාලන පක්ෂ චෝදනා කළේය. විපක්ෂයේ දේශපාලන කාර්යාල වලට එල්ල වූ ප්‍රහාර වලටද මෙම කණ්ඩායම වගකිය යුතු බවට චෝදනා එල්ල වූ අතර එක්සත් ජාතික පක්ෂයේ, ජනතා විමුක්ති පෙරමුණේ සහ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කාර්යාල ගණනාවට මේ ආකාරයේ ප්‍රහාර එල්ල විය. සිය කාර්යාල 30ක් (සැප් 12 වන විට) ප්‍රහාරයට ලක් වී ඇති බව ජනතා විමුක්ති පෙරමුණට ප්‍රකාශ කළේය. "මෙම පහරදීම් සඳහා රජා බලය සෘජුවම යොදා ගෙන ඇත. වෙඩි තැබීමේ සිදුවීම් 4ක් වාර්තා වී ඇත. කෙසේ වුවත් මේ සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකු අත්තඩංගුවට ගෙන නොමැත. " යනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රකාශ කළේය. "එක්සත් ජනතා සන්ධානයට මොනරාගල දිස්ත්‍රික්කය තුළ මැතිවරණ කාර්යාල 219 යෙදවීමට මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් අවසර ලබා දී ඇති නමුත් පාලක පක්ෂය විසින් කාර්යාල 970ක් පවත්වාගෙන යනු ලැබූ බවත් ඉන් බොහොමයක් හුදෙක් මැතිවරණ ප්‍රචාරණය සඳහා පමණක් ආරම්භ කළ ඒවා බවත් කැෆේ ආයතනය ප්‍රකාශ කළේය.



**ජනතා විමුක්ති පෙරමුණේ මැතිවරණ ප්‍රචාරක කාර්යාල ගණනාවක් ප්‍රහාරයන්ට ලක් වී විනාශ විය** (Photo: Lanka Truth)

කෙසේ වෙතත් එල්ල වූ ප්‍රහාර නිසා එක්සත් ජාතික පක්ෂයට සහ ජනතා විමුක්ති පෙරමුණට අවසර ලත් කාර්යාල ගණනවත් (එජාප 163 , ජවිපෙ 73 ) පවත්වාගෙන යාමට නොහැකි විය".

http://www.colombopage.com/archive_14B/Sep08_1410153162CH.php (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

http://news.xinhuanet.com/english/world/2014-08/27/c_133590700.htm (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

http://cmev.wordpress.com/ (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)

http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7591:president-is-the-biggest-obstacle-for-free-and-fair-election--jvp-&catid=36:top-stories&Itemid=124 (අවසන් පිවිසුම් දිනය 2014 සැප් 14)